# *16 වන දවස*

## ඔබගේ රාජ්‍යය පැමිණේවා !

ක්‍රිස්තුන් වහන්සේ පියාණන් වහන්සේගේ සැලැස්මට එහෙයි කී සේක. තම ජීවිත ගමනේ දී පිය සමිඳාණන්ගේ සිහිනය දිග හැරෙන්නට ඉඩ හැරිය සේක. දුක, වේදනාව, නින්දාව, අපහාසය, පීඩාව හමුවේ එහෙයි කී සේක.

**"ඔවුන් වහන්සේ දෙවියන් වහන්සේගේ ස්වරූපය දැරූ නමුත්, දෙවියන් වහන්සේ හා සමානත්වය, තමන් විසින් බදාගෙන තබා ගත යුතු වස්තුවනකැයි නොසිතා, එය ඉවතලා සේවකයකුගේ ස්වරූපය ගෙන අප හා සමාන මිනිස් කෙනෙක් වූ සේක. මනුෂ්‍යාකාරයෙන් සිටිමින් ඔවුන් වහන්සේ මරණය එනම් කුරුසියේ මරණය දක්වා පහත් වී කීකරු වූ සේක"** (පිලිප්පි 2:6-8). ඔවුන් වහන්සේ තම ජීවිතය පූජා කරමින් දේව රාජ්‍යය සඳහා ම කැප වූ සේක. එය ම ජයග්‍රහණයට හේතු විය.

අප කෙසේද දේව කැමැත්තට එහෙයි කියන්නේ............? මොහොතක් අප දෙසට නෙත සිත යොමු කරමු. දෙවියන් වහන්සේගේ හඬට ඇහුම්කන්දීම, කීකරුවීම හා අවනත වීම කෙබඳු ද? අප අපට කැමති ලෝකයක ද ජීවත් වන්නේ? ධනය, බලය, නිලය නිසා හිස උදුම්මාගෙන ද සිටින්නේ? සේවක නායකත්වය, ජීවිත නායකත්වය අපට අමතක වෙලා ද? එය එසේනම් අප අපෙන් හැරෙමු. දේව රාජ්‍යයේ වටිනාකම් අප අතර බිහිවෙන්නට ඉඩදෙමින් දේව රාජ්‍යය දකිමු. ඔවුන් වහන්සේගේ අභිරහස්මක සැලැස්ම අප තුළින් දිග හැරෙන්නට ඉඩදෙමු. අවනත වෙමු.

**දවස පුරා :-**

- ✵ **දෙවිඳුනි මා විමසා බලා මගේ සිත දැනගත මැනව. මා පරීක්ෂා කර මාගේ සිතුවිලි දැනගත මැනව. සදා මාර්ගයේ මා ගෙන ගිය මැනව** (ගීතාවලිය 139:23-24).
- ✵ ශු. මතෙව් 13:44-52
- ✵ පුබුදු ගීතාංජලී ගී අංක 282